# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2209/42 - 2021 ජනවාරි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2021.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 03/2021 දරන සුරාබදු නිවේදනය

**බෝතල් කරන ලද රා**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥා පනතේ (52 වන අධිකාරය) 22 වැනි වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම 2021 ජනවාරි මස 08 වැනි දින බලපැවැත්වෙන පරිදි;

(1) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ, ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් වෙනුවෙන් රුපියල් විසිපහක් (රු. 25/=) වන බද්දක් අයවිය යුතු යැයි ද ;

එසේ වුවද, ඉහත කී බෝතල් කරන ලද රා දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන කවර ප්‍රමාණයක් වෙනුවෙන් වුවද එකී බද්ද අය නොකළ යුතු යැයි ද ;

(2) 2016 දෙසැම්බර් මස 20 වැනි දින අංක 1998/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 993 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද;

නියම කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය"

01- 555


1A - PG 5263 — 600 (2021/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*